ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,218 — 2002 ජනවාරි 04 වැනි සිකුරාදා — 2002.01.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

තනතුරු – ඇබෑර්තු

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය
අධ්‍යක්ෂ තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

වර්තමාන අධ්‍යක්ෂවරයාගේ කොන්ත්‍රාත් කාලසීමාව 2002 ජූනි මස 09 වැනිදා අවසන් වේ. එබැවින් තලවාකැලේ තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ධුරය සඳහා (කොන්ත්‍රාත් පදනමින්) බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රාජකාරියේ ස්වභාවය :

(අ) තේ පර්යේෂණ මණ්ඩලයේ මහ පෙන්වීම සහ පාලනය මත තේ පර්යේෂණායතනයේ පරිපාලනමය කටයුතු පිළිබඳ වගකීම ;

(ආ) තේ පර්යේෂණ මණ්ඩලය මගින් පවරනු ලබන මණ්ඩලය සතු බලතල ක්‍රියාකාරකම් සහ රාජකාරි කටයුතු ඉටු කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට ; අධ්‍යක්ෂවරයා බැඳී සිටී.

සුදුසුකම් සහ පළපුරුද්ද.- පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යා, කෘෂිකර්ම, ඉංජිනේරු හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් ආචාර්ය උපාධියක් තිබීම. විවිධ විෂය ක්ෂේත්‍රයන්හි කටයුතු කරන විද්‍යාඥයන් කණ්ඩායමකට නායකත්වය දීමට හා මහ පෙන්වීමට මනා හැකියාවක් අයදුම්කරු සතු විය යුතුයි. කාර්ය මණ්ඩලය කාර්යක්ෂම ලෙස සහ වඩාත් උචිත පරිදි කාර්යයන්හි යෙදවීමට ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස.– අයදුම් කළ හැකි අවසන් දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතුයි.

වැටුප.– සාකච්ඡා කරගත හැක.

තෝරාගනු ලබන අයදුම්කරු කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටවනු ලැබේ. තෝරාගත් අයදුම්කරු ආයතනයේ නිලධාරියකු නම්, කොන්ත්‍රාත් කාලය අවසන් වූ පසු ඔහු හෝ ඇය දරනු ලැබූ තනතුරට නැවත පත් කරනු ලැබේ.

අනෙකුත් ප්‍රතිලාභ :

(1) කුලී අයකිරීමක් රහිත, සියළු පහසුකම් සහිත, තේ පර්යේෂණායතනය තුළ පිහිටා ඇති නිවසක්,

(2) පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය පහසුකම්,

(3) අර්ථසාධක අරමුදලට දායකත්වය, තෝරාගත් අයදුම්කරුගේ වැටුපෙන් 10%ක් සහ එම වැටුපෙන් 15%කට සමාන මුදලක් ආයතනය මගින්ද අර්ථසාධක අරමුදලට බැරකරනු ලැබේ,

(4) වැටුපෙන් 3%කට සමාන මුදලක් ආයතනය මගින් සේවකයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ,

(5) වැටුප ආදායම් බදුවලින් නිදහස්ය.

(6) ගෘහස්ථ කම්කරුවන් හතර දෙනෙකු සඳහා නියමිත දීමනාව (නිවස තුළ 02 සහ නිවසින් පිටත 02),

(7) රජයේ පවතින නීතිරීතිවලට අනුකූලව සුළු ගෙවීමකට යටත්ව, අයදුම්කරුගේ අභිමතය පරිදි සීමිත පුද්ගලික පරිහරණය සඳහාද යොදාගත හැකි වන පරිදි වාහනයක් ; සහ

(8) තේ පර්යේෂණායතනයේ කාර්ය මණ්ඩලයට නියමිත අනෙකුත් ප්‍රතිලාභ.

සියළුම විස්තර සහිත අයදුම්පත, අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම පිළිබඳ නිර්දේශ කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද අදාළ සහතික පත්‍රවල පිටපත් ද සමග 2002 පෙබරවාරි මස 15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියැලී සිටින අය තමාගේ අයදුම්පත අදාළ ආයතනයේ ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
තේ පර්යේෂණ මණ්ඩලය.

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය,
තලවාකැලේ.
01 – 50

බුද්ධ ශාසන අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
ශාසනාරක්ෂක මණ්ඩල කටයුතුවලට සහායවීමට අභ්‍යාසලාභීන් වශයෙන් උපාධිධාරි භික්ෂූන් වහන්සේලා බඳවාගැනීම

බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ශාසනාරක්ෂක මණ්ඩලවල කටයුතු සඳහා උපාධිධාරි අභ්‍යාසලාභීන් වශයෙන් බඳවා ගැනීම පිණිස දැනට රාජ්‍ය සේවයේ (මධ්‍යම/පළාත්) ස්ථිර සේවයේ නොයෙදෙන උපාධිධාරි භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2002 ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ බෞද්ධ කටයුතු කොමසාරිස්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, අංක 135, ධර්මපාල මාවත, කොළඹ 7 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපාධිධාරි අභ්‍යාසලාභී භික්ෂූන් වහන්සේලා බඳවා ගැනීම" යන්න සඳහන් කළයුතු අතර අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත්‍ර බුද්ධ ශාසන අමාත්‍යාංශයේ හෝ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු අතර, එය "බෞද්ධ කටයුතු කොමසාරිස්" යනුවෙන් විය යුතුය.

03. *සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර එක් වර්ෂයක කාලයක් සඳහා අභ්‍යාසලාභී පදනම මත ක්‍රියාත්මක වේ.

(ii) එක් වර්ෂයක කාලය අවසානයේ දී මෙම තනතුරුලාභීන් ස්ථිර සේවක සංඛ්‍යාවට බඳවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

04. *වැටුප් හා දීමනා*.– අභ්‍යාසලාභී කාලය තුළ මසකට සියල්ල ඇතුළත් රු. 4,000ක දීමනාවක් ගෙවනු ලැබේ. සේවයේ ස්ථිර කිරීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන වැටුප් පරිමාණය පිරිනමනු ලැබේ.

05. *අවශ්‍ය සුදුසුකම්*.– සෑම අයදුම්කරුවෙකුම,

(i) සිංහල භාෂාවට / දෙමළ භාෂාවට සාමාර්ථයක් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 06කින් එකවර සාමාර්ථය ලබා තිබීම.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය, පුරාවිද්‍යාව, තර්ක ශාන්ත්‍රය, පාලි, සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයයක් සහිතව ලබාගත් සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය හෝ ඉහත සඳහන් එක් ප්‍රධාන විෂයයකින් ලබාගත් ගෞරව ශාස්ත්‍රවේදී හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම.

(iii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම

(iv) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩිවීම යන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

06. පහත සඳහන් ලියකියවිලි සියල්ල හෝ ඕනෑම එකක් අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය

(ආ) ජාතික හැඳුනුම්පත

(ඇ) ස්වකීය ආචාර්ය ස්වාමීන්වහන්සේ/උපාධ්‍යය ස්වාමීන්වහන්සේ/ විහාරාධිපති ස්වාමීන්වහන්සේගෙන් ලබාගත් සහතිකයක්

(ඈ) බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවිය සිටින බවට සාමනේර/උපසම්පදා සහතික

07. *තනතුරට අයත් රාජකාරි ස්වභාවය* :–

(i) බොදු දහම් පාසල් දරුවන්, විහාරස්ථාන දායකකාරකාදීන් හා සෙසු මහජනතාවගේ ගැටලු සම්බන්ධයෙන් අවධානයෙන් සිටීම, ඒවා සම්බන්ධයෙන් දිස්ත්‍රික්/ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල සභාපති/ලේඛකාධිකාරි ස්වාමීන්වහන්සේලා සමග සාකච්ඡා කර විසඳුම් ලබාදීමට ක්‍රියාකිරීම.

(ii) අදාල වෙනත් ආයතන හා නිලධාරින් හමුවී ඉහත කරුණු ඔවුන්ගේ අවධානයට යොමුකර අවශ්‍ය උපදෙස් ලබා ගැනීම.

(iii) විහාරස්ථාන හා දහම් පාසල් ද, බෞද්ධ දායක පවුල් ද අතර සම්බන්ධතාව තහවුරුකොට වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

(iv) විහාරස්ථානය බෞද්ධයාගේ අභිවෘද්ධිය සලසන මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාමේ ක්‍රියාමාර්ග ගැනීම හා සාරධර්ම ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.

(v) බොදු දහම්පාසල්වල කාර්යයන් ප්‍රවර්ධනයට අදාල තොරතුරු රැස්කිරීම, විහාරස්ථාන, ආරණ්‍ය සේනාසන, බෞද්ධ මධ්‍යස්ථාන, සිල්මාතා ආරාම ආදිය පිළිබඳ දත්ත රැස් කිරීම, බෞද්ධ දහම් පාසල්වල ශිෂ්‍යයන් හා ගුරුවරුන් පිළිබඳ දත්ත රැස්කිරීම, බෞද්ධාගමික පුරාවස්තු සම්බන්ධ විස්තර රැස් කිරීම හා ඉහත සඳහන් තොරතුරු ක්‍රමවත්ව හා කාලීනව පවත්වාගෙන යාමට දායක වීම හා ඒවා අවශ්‍යවන අවස්ථාවන්හිදී බුද්ධ ශාසන අමාත්‍යාංශයට හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට දායක වීම.

(vi) දහම් පාසල් පොත් බෙදාහැරීම, පරිහරණය හා ගබඩා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

(vii) දහම් පාසල් අරමුදල සඳහා ආධාර එකතු කිරීම හා එම අරමුදලේ ප්‍රතිලාභ තම බල ප්‍රදේශයේ දහම් පාසල්වලට ලබාදීම සඳහා කටයුතු කිරීම.

(viii) දහම් පාසල් අධ්‍යාපන කාර්යයන් වඩාත් ප්‍රයෝජන වනසේ ගොඩනගා ගැනීමට ක්‍රමෝපායන් අධ්‍යයනය කර ක්‍රියාත්මක කිරීම.

(ix) ප්‍රාදේශීය/දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරි හිමිවරුන්/ සභාපති හිමිවරුන් මෙන්ම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්වරුන් සමග මනා සම්බන්ධතාවයක් තබා ගැනීම සහ ඔවුන්ගේ අදහස් හා උපදෙස් අනුව හැකි සෑම අවස්ථාවකදීම රාජකාරි කටයුතුවල නියැලීම.

(x) ස්වේච්ඡා සංවිධාන, දානපතියන් හා වෙනත් පරිත්‍යාගශීලීන් සමග සාකච්ඡා කර, විහාරස්ථාන හා දහම් පාසල් වැඩිදියුණු කිරීමට ආධාර උපකාර ලබා ගැනීම.

(xi) බුද්ධ ශාසන අරමුදල, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙන ආධාර හා ප්‍රදාන විහාරස්ථානවලට ලබාදීමේදී ඉදිරිපත් වන ඉල්ලුම්පත්‍රවල තොරතුරු පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කිරීමට ලේකම් හිමිවරුන්ට සහාය වීම.

(xii) විදේශීය භික්ෂූන් වහනසේලා පිළිබඳව වාර්තා සැපයීම, ප්‍රගති වාර්තා අදාල විහාරස්ථානවලින් ලබා ගැනීම හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත වාස වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී ලේකම් ස්වාමීන් වහන්සේට සහාය වීම.

(xiii) බෞද්ධ විරෝධී කටයුතු පිළිබඳව විශේෂ අවධානයෙන් කටයුතු කිරීම, බෞද්ධාගමික වශයෙන් වැදගත් වන ඕනෑම කටයුත්තක් ඉටු කිරීමට දායක වීම හා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව විසින් වරින්වර පවරනු ලැබිය හැකි වෙනත් රාජකාරි කටයුතු ඉටු කිරීම.

(xiv) ඉහත කී මෙම සියලුම රාජකාරි කටයුතු ශාසනාරක්ෂක මණ්ඩල ලේකම්/සභාපති ස්වාමීන්වහන්සේගේ උපදෙස් පිට ඉටු කිරීම.

08. රාජ්‍ය සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට් පත්‍රයේ* (IIආ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි අදාලවන අතර ඒවා කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

09. අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසු අභ්‍යාසලාභීන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

දොං. ව. අබේවික්‍රම,
බුද්ධ ශාසන ලේකම්.

2001 නොවැම්බර් මස 29 දින,
බුද්ධ ශාසන අමාත්‍යාංශය, 135, ධර්මපාල මාවත,
කොළඹ 07.

බුද්ධ ශාසන අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
ශාසනාරක්ෂක මණ්ඩල කටයුතුවලට සහායවීමට අභ්‍යාසලාභීන් වශයෙන් උපාධිධාරි භික්ෂූන් වහන්සේලා බඳවා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත

1. නම : පූජ්‍ය ..... හිමි
2. ලිපිනය :————,
3. (i) අයත් නිකාය හා පාර්ශ්වය :————,
   (ii) මහානායක මාහිමිපාණන් වහන්සේගේ නම හා ලිපිනය :————,
   (iii) (අ) ඉල්ලුම්කාර ස්වාමීන්වහන්සේ පැවිදි වූ දිනය :————,
   (ආ) සාමණේර අංකය :————,
   (ඇ) උපසම්පදා වූ දිනය :————,
   (ඈ) උපසම්පදා අංකය :————,
   (iv) භික්ෂු හැඳුනුම්පත් අංකය/ජාතික හැඳුනුම්පත් අංකය :————,
4. උපන් දිනය :
   වර්ෂය :————, මාසය :————, දිනය :————.
5. අයදුම්පත් බාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :————, මාස :————, දින :————.
6. (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර :

සමත්වූ වර්ෂය	*විභාග අංකය*	*විෂයයන්*	*ලබා ඇති ශ්‍රේණිය*
		.....	.....
		.....	.....
		.....	.....
		.....	.....
		.....	.....
		.....	.....
		.....	.....
		.....	.....

   (ii) සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ විශේෂවේදී හෝ ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව පිළිබඳ විස්තර :
   (අ) ලබා ඇති උපාධිය :————,
   (ආ) විශ්ව විද්‍යාලය :————,
   (ඇ) උපාධිය ලැබූ වර්ෂය :————,
   (ඈ) උපාධියට හැදෑරූ විෂයයන් :————,
   (ඉ) භාෂා මාධ්‍යය :————,
7. (i) අභ්‍යාසලාභී තනතුරක් ලදහොත් සේවය කිරීමට කැමැති දිස්ත්‍රික්කය :————,
   (ii) සේවය කිරීමට කැමැති එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් (ප්‍රාදේශීය ශාසනාරක්ෂක බලමණ්ඩල) කොට්ඨාශ තුනක් (කැමැත්තේ අනුපිළිවෙලට)
   (අ) :————,
   (ආ) :————,
   (ඇ) :————,
8. දැනට සේවයේ යෙදී ඇත්නම් එකී පත්වීමේ ස්වභාවය, තනතුර හා සේවා යෝජකයාගේ නම හා ලිපිනය :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඔප්පු වුවහොත් මා කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි. කිසියම් දිනෙක සිට මා උපැවිදි වන්නේද එදින සිට ම මෙම තනතුරෙන් මා ඉවත් වූවාසේ සැලකෙන බවද මා හොඳාකාරවම දනිමි.

තවද, මම දැනට රාජ්‍ය සේවයේ (මධ්‍යම හෝ පළාත්) ස්ථිර රැකියාවක නොයෙදෙන බව ද වැඩි දුරටත් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.
01-125

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සරප් සේවයේ II'ආ' බණ්ඩයේ නිලධාරීන් II'අ' පන්තියට උසස් කිරීමේ විභාගය - (1999) (මධ්‍යම රජය)

1999 ඔක්තෝබර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද *ගැසට්* නිවේදනය ප්‍රකාරව 2000.03.25 දින පවත්වනු ලැබූ යථොක්ත විභාගයේ ප්‍රතිඵල අනුව සරප් සේවයේ II වැනි පන්තියේ 'අ' බණ්ඩයට උසස් කිරීම සඳහා මෙහි පහත නම් සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට යටත්ව තෝරාගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනු අංකය	*විභාග අංකය*	*නම*	*ලිපිනය*	
01	0007	ඩබ්. ටී. සම්පත් කුමාර	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
02.	0038	පී. එච්. ධර්මසිරි	මිණුම් අංශය, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01.	සමත්

අනු අංකය	විභාග අංකය	නම	ලිපිනය	
03.	0027	සී. ජී. ඩී. ප්‍රනාන්දු	විගණකාධිපති දෙපාර්තමේන්තුව, කොළඹ 07.	සමත්
04.	0024	ඩී. එච්. එම්. මුදිතා කුමාරි	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.	සමත්
05.	0032	ජේ. එච්. ඒ. සී. ජයතිලක	කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 03.	සමත්
06.	0021	එන්. පී. බැද්දගේ	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, කොළඹ 10.	සමත්
07.	0023	වයි. අයි. ඩී. ජයසිරි	රජයේ කර්මාන්ත ශාලාව, වැල්ලම්පිටිය.	සමත්
08.	0010	කේ. බී. ඩී. වීරසිංහ	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
09.	0037	එච්. ඩී. එම්. සී. නානායක්කාර	විභාග දෙපාර්තමේන්තුව, කොළඹ 02.	සමත්
10.	0030	එච්. බී. එන්. ධනඤ්ජලී	සැළසුම් ක්‍රියාත්මක කිරීම සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල.	සමත්
11.	0029	පී. ඩී. ඒ. වයලට්	සමාජ සේවා දෙපාර්තමේන්තුව, කොළඹ 08.	සමත්
12.	0034	එච්. ඒ. ආර්. ලක්මිණී	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට.	සමත්
13.	0017	යූ. වික්‍රමසිංහ	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 10.	සමත්
14.	0004	ඩබ්. එම්. ඊ. එල්. ජයවර්ධන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල.	සමත්
15.	0019	කේ. පී. එන්. කේ. කුමාරි	සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 03.	සමත්
16.	0042	ඩී. ආර්. එස්. කේ. දසනායක	සිවිල් පරිපාලන අධ්‍යක්ෂ කාර්යාලය, කොළඹ 03.	සමත්
17.	0006	පී. එම්. ජේ. පෙරේරා	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
18.	0014	කේ. ඩික්මන්	ආහාර දෙපාර්තමේන්තුව, කොළඹ 02.	සමත්
19.	0020	ඊ. එස්. එල්. පෙරේරා	සංචාරක කටයුතු හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, කොළඹ 03.	සමත්
20.	0028	ආර්. එම්. එස්. පී. කේ. රත්නායක	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල.	සමත්
21.	0005	කේ. ලාල් කුමාර	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
22.	0008	වී. ටී. ඩී. අමරකෝන්	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
23.	0040	ඒ. ජී. එම්. ඩී. වික්‍රමසිංහ	තැපැල් දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල.	සමත්
24.	0044	ආර්. ඒ. එල්. කේ. රාමනායක	වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිල්දණ්ඩාහින්න.	සමත්
25.	0009	කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක	ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලය, කොළඹ 10.	සමත්
26.	0033	ඩබ්. ඒ. පී. වීරසේකර	නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.	සමත්
27.	0002	ජී. බී. එම්. අයි. කේ. වික්‍රමසිංහ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.	සමත්
28.	0022	එන්. රැටියල	සමෘද්ධි, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, කොළඹ 07.	සමත්
29.	0015	ඩබ්. ඒ. එන්. කේ. වික්‍රමආරච්චි	ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, නාරම්මල.	සමත්
30.	0041	බී. ජී. එන්. තුෂාරි	තැපැල් දෙපාර්තමේන්තුව, අනුරාධපුරය.	සමත්

කේ. පී. එම්. ස්පෙල්ඩ්වින්ඩ්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2001 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සහා පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ,
ඒකබද්ධ සේවා අංශයේ දී ය.
01 – 94

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ යතුරු ලේඛක සේවයේ II'අ' ඛණ්ඩයේ නිලධාරීන් I පංතියට උසස් කිරීමේ විභාගය – 1999 (මධ්‍යම රජය)

1999 ඔක්තෝබර් 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද *ගැසට් නිවේදනය* ප්‍රකාරව 2000.03.25 දින පවත්වනු ලැබූ යථෝක්ත විභාගයේ ප්‍රතිඵල අනුව යතුරු ලේඛක සේවයේ I පංතියට උසස් කිරීම සඳහා මෙහි පහත නම් සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් සුදුසුකම් පරීක්ෂා කිරීමට යටත්ව තෝරාගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනු අංකය	නම	රාජකාරි ස්ථානය	ගිණුම් ක්‍රම	ආයතන හා කාර්ය පරිපාටිය
(1)	බී. ඩී. ඩබ්. සී. ධර්මවංශ	ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, අගලවත්ත	සමත්	සමත්
(2)	ටී. විජේතුංග	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02	සමත්	සමත්
(3)	එම්. එම්. ඉන්ද්‍රලතා	දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය, ගාල්ල	සමත්	සමත්
(4)	කේ. කේ. ඩී. ඩී. මාලනී	සැළසුම් ක්‍රියාත්මක කිරීම සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල.	සමත්	සමත්

කේ. පී. එම්. ස්පෙල්ඩ්වින්ඩ්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2001 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා,
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ දී ය.
01 – 95

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බෝම්බු ගම්මන පිහිටි කහටගහවත්ත නමැති ඉඩම (ප්‍රමාණයෙන් අක්. 0 රූ. 2 පර්. 23.5 ක ඉඩම) ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඊ. කරුණාරත්න විසින් සහතික කරන ලද 1995 නොවැම්බර් මස 2 වැනි දින හා අංක 10184 දරන උකස් බැඳුම්කරය මගින් අනුර හේවාවසම් බැඳුම්කරු වශයෙන්ද ජයසේකර මුදලිගේ දොන් ප්‍රේමවර්ධන සහ ජයසේකර මුදලිගේ ඝානා ජයසේකර උකස්කරුවන් වශයෙන් ද උකස් කරන ලද ඒ මත අයවිය යුතු ගෙවීම් පැහැර හැරි දේපළ).

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද අධිකාරි බලය ප්‍රකාර මතු දැක්වෙන මුදල් අයකර ගැනීම සඳහා ම විසින් 2002 ජනවාරි 21 වැනි සඳුදා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(අ) මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඊ. කරුණාරත්න විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමට ලියා සහතික කරන ලද 1995 නොවැම්බර් මස 2 දින හා අංක 10184 දරන බැඳුම්කරය යටතේ අනුර හේවාවසම් බැඳුම්කරු වශයෙන් හා ජයසේකර මුදලිගේ ඝානා ජයසේකර උකස්කරුවන් වශයෙන් ද, එකී බැඳුම්කරය යටතේ කළයුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් 1999 ජනවාරි මස 31 දිනට ඔවුන්ගෙන් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට රුපියල් අටලක්ෂ වි සිතුන් දහස් හයසිය දහයයි ශත විසිහයක මුදලක් අයවිය යුතු හෙයින් ද,

(ආ) මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඊ. කරුණාරත්න විසින් සහතික කරන ලද 1995 නොවැම්බර් මස 2 වැනි දින හා අංක 10184 දරන උකස් බැඳුම්කර යටතේ අනුර හේවාවසම් බැඳුම්කරු වශයෙන් ද, ජයසේකර මුදලිගේ පූජිත අචින්තනාත් ජයසේකර බැඳුම්කරු හා උකස්කරු වශයෙන් ද, ජයසේකර මුදලිගේ දොන් ප්‍රේමවර්ධන සහ ජයසේකර මුදලිගේ ඝානා ජයසේකර උකස්කරුවන් වශයෙන් ද, 1999 ජනවාරි මස 31 වැනි දිනට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට රුපියල් දොළොස් ලක්ෂ විසිදහස් නවසිය අසූහයක් (රු. 12,20,986) ගෙවිය යුතු හෙයින් ද,

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල අනුව එකී අංක 10184 බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට උකස් තබා ඇති මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් හා සවිස්තරව විස්තර කොට ඇති දේපළ ඉහත කී රු. 20,44,596.26 ක මුදල ද, ඒ මුදල සඳහා 1999 පෙබරවාරි 1 වැනි දින සිට වෙන්දේසි දින තෙක් පොලිය ද සමග එතෙක් කළ යම් ගෙවීමක් (ඇත්නම්) එය අඩුකොට අයකර ගනු පිණිස කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. ඩබ්ලිව්. කෙලාට් ලවා වෙන්දේසියේ විකුණාලිය යුතු බවට යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හා ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, බෝම්බුගම්මන ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. මෙන්ඩිස් විසින් පිළියෙල කරන ලද 1992.12.30 දාතම හා අංක 461/1 දරන පිඹුරේ කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 බී වශයෙන් බෙදා වෙන්කළ උතුරට : ඊ මාන්නප්පෙරුමගේ ඉඩම ද, මහින්දගේ කුඹුර හා ජූලියන් ප්‍රනාන්දුගේ ඉඩම වෙන්කරන ඇල ද, නැගෙනහිරට: ජූලියන් ප්‍රනාන්දුගේ සහ එන්. පෙරේරාගේ ඉඩම ද, දකුණට : කොළඹ සිට කුරුණෑගල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ද, බටහිරට : ලොට් 1 ඒ හා ඊ. මාන්නප්පෙරුමගේ ඉඩම ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි ,පර්චස් විසිතුනයි දශමපහක් (අක්. 0 රූඩ් 02, පර්. 23.5) වන බෙදා වෙන්කොට නිර්ණය කළ ඉඩම එහි පිහිටි සෑම සියළු දේ සමගය.

යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය සඳහා 1999.08.19 හා 1999.08.24 දින *රජයේ ගැසට් පත්‍රය* හා ඩේලිනිව්ස්, තිනකරන් හා දිවයින පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය. :

1. මිළ තීන්දු වූ වහාම ගැනුම් මිලෙන් 10%ක් ;
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත;
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) ;
4. විකුණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල;
5. රු. 28,192 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%ක් ;
6. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500ක් ;
7. වෙන්දේසියේ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500 ක් .

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන, කොළඹ 3, ආර්. ඒ ද මෙල් මාවත, අංක 10, හේමචන්ද්‍ර ගොඩනැගිල්ලේ, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු, නීති (ණය අයකර ගැනීම්) (දුරකථන අංක 441179 සහ 075-335208) වෙතින් ලබා ගෙන පරීක්ෂා කර බැලිය හැකිය.

ඩන්ස්ටන් සහ ඩැලස් කෙලාට්,
උසාවි කොමසාරිස්වරු සහ බ්‍රෝකර්වරු,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ
දේපළ නියෝජිතයෝ.

අංක 381 1/1, ගාලු පාර, කොළඹ 4,
දුරකථන අංකය: 591167,
දුරකථන/ෆැක්ස්: 584874, 500838,
ක්ෂණික ඇමතුම් : 0722 -50422.
01-137

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව

1990 අංක 4 දරන බැංකුව විසින් ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ මහර පහළ කරගහඅමුණ පිහිටි කොස්ගහවත්ත, කොස්ගහවත්ත කැබැල්ල සහ කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කරනු ලැබූ බලය ලත් මානක ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදනු ලැබූ අංක 2649 සහ 1996 අගෝස්තු 15 වන දිනැති පිඹුරෙහි අංක 1 දරන කැබැල්ල ලෙස දක්වා ඇති, උතුරට : අංක 1350 දරන පිඹුරෙහි අංක 12 දරන කැබැල්ල හා ඇලෙන් ද, නැගෙනහිරට : කෝන්ගහ වත්තෙන් ද, දකුණට : අංක 2649 දරන පිඹුරෙහි අංක 2 සහ 4 දරන කැබැලි වලින් ද, බස්නාහිරට : අංක 1350 දරන පිඹුරෙහි අංක 12 දරන කැබැල්ලෙන් ද මායිම් වන අතර එකී අංක 2649 දරන පිඹුරට අනුව පර්චස් විසි අටයි දශම පහයි හතර (අ. 0 රූ. 0 ප. 28.54) ක වර්ග ප්‍රමාණය ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, මහර පහල කරගහඅමුණ පිහිටි කොස්ගහවත්ත කොස්ගහවත්ත කැබැල්ල සහ කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කරනු ලැබූ බලයලත් මානක ඩබ්. බී. එල් ප්‍රනාන්දු විසින් සාදනු ලැබූ අංක 2649 සහ 1996 අගෝස්තු 15 වන දිනැති පිඹුරෙහි අංක 2 දරන කැබැල්ල උතුරට : අංක 2649 දරන පිඹුරෙහි අංක 1 දරන කැබැල්ලෙන් ද, නැගෙනහිරට : කෝන්ගහ වත්තෙන් ද, දකුණට : අංක 2649 දරන පිඹුරෙහි අංක 3 දරන කැබැල්ලෙන් ද, බස්නාහිරට: අංක 2649 දරන පිඹුරෙහි අංක 4 දරන කැබැල්ලෙන්ද මායිම් වන අතර එකී අංක 2649 දරන පිඹුරට අනුව පර්චස් විසිදෙකයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 22.40) ක වර්ග ප්‍රමාණය ඇත.

එකී අංක 1431 සහ 1997.08.22 දිනැති බැඳුම්කරයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතියද සමඟ වේ.

එකී දේපල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරුකේෂ්වරන් විසින් සහතික කරන ලද්දා වූවද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 1997.08.22 දින සහ අංක 1431 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම මුතුතන්ත්‍රිගේ කුමුදු සනත් ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී දේපළ හා පරිශ්‍රය සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා දී ඇති බලතල අනුව 1990 අංක 4 දරන බැංකුව විසින් ණය ආපසු අය කර ගැනීමේ විශේෂ විධිවිධාන පනත අනුව 2002.01.17 දින පෙ. ව. 11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසිය හැකි මාර්ගය.– කඩවත කොළඹ මාර්ගයෙන් නුවර මහා මාර්ගයට පැමිණ රාගම පාරට හැරී කිලෝමීටර් 1.6 ඉදිරියට ගියවිට අතුල කේටර්ස් නාමපුවරුව හමුවේ. එතනින් වම්පසට හැරී ජයසිංහ මාවත දිගේ මීටර් 300 ක් ගිය විට 3 වෙනි පටුමගේ මීටර් 150 ගිය විට අදාළ දේපල හමුවේ. කොළඹ සිට මෙම දේපලට කිලෝ මීටර් 18 ක් පමණ ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2001 අප්‍රේල් 06 දින දරන *ගැසට් පත්‍රය* සහ 2001 අප්‍රේල් මස 23 දින ඩේලි නිවුස් දිවයින හා තිනකරන් පුවත් පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.– වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මුදලින් 10%ක් ද ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2%ක් වියදම් වන අතර ;
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ;
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ද වේ.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල ජ්‍යෙෂ්ඨ කළමණාකාරිනී (ණය පරීක්ෂක හා අයකර ගැනීම) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 10 ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03, වෙත ලබා දිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාල තොරතුරු විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමණාකාරිනී (ණය පරීක්ෂක හා අයකර ගැනීම) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අංක 10, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03. දුරකථන අංක : - 075–335208 හෝ 304271.

රංජිත් එස්. මහානාම,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 863121.
01-82

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ඩාර්ලි පාර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපලක් හා යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උපලේඛනය 1

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම්පත්තුවේ

කඳාන සුළු නගර සහා සීමාව තුළ හල්පෙ මාවත *නොහොත්* හල්පෙ පටුමග පිහිටි හල්පෙ මාවත වරිපනම් අංක 39 දරන කනත්තවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද අංක 2778 හා 1981.06.02 දාතම දරන පිඹුරේ ලොට් බී වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙනස් කොට මායිම් නිර්ණය කර ඇති සම්පූර්ණ ඉඩම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් හා වෙනත් සෑම සියලු දේ ද සමග ඉඩම ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 1, පර්චස් 20.

උපලේඛනය 2

පහත දැක්වෙන සියළු හා තනි යන්ත්‍ර සූත්‍ර –

1. ස්වයංක්‍රීය අධිවේගී ෆාස්ට්නර් වේන් මැෂින් වර්ගය පී - 6 පහත සඳහන් දේ සමඟ –
   (අ) සුන්බුන් එකතු කිරීමට රික්තක පොම්පය හා ටැංකිය,
   (ආ) ලෝහ කම්බිය (මෙටලික් වයර්) සඳහා ස්ටැන්ඩ් සහ ස්පූල්,
   (ඇ) ගැප් ස්පේස් පාලන පද්ධතිය (කෝන්ට්‍රෝල් සිස්ටම්),
2. ෆාස්ට්නර් පොලිෂින් යන්ත්‍රය, මෝටරය සමග,
3. ෆාස්ට්නර් අයනින් හා වැක්සින් යන්ත්‍රය, මෝටරය හා හීටරය සමග,
4. ෆාස්ට්නර් ටීත් කටින් යන්ත්‍රය, මෝටරය සමග,
5. එස් එල් 32 සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය ලෙන්ත් කටින් සහ ටීත් ක්ලීනින් යන්ත්‍රය.

ඉහත පළමුවන උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති ඉඩමේ පිහිටි ගොඩනැගිල්ලට සවිකර ඇති මොනයම් අන්දමේ හෝ වෙනත් සියළු යන්ත්‍රෝපකරණ හා ඒවාට අයත් සියළු අංගෝපාංග ද සමග එස්. අයි. ගුණසේකර විසින් සහතික කරන ලද අංක 419 හා 1984.02.27 දාතම දරන බැඳුම්කරය ප්‍රකාර ගෙවිය යුතු ගෙවීම් වීජී සිප් කොම්පැනි ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්, එකී වීජී සිප් කොම්පැනි ලිමිටඩ් විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට උකස් තබන ලද දේපල සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල ප්‍රකාර 2002 ජනවාරි මස 23 වැනි දා බදාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය- මිළ තීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය : -

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩකරන දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බදු 1%ක් (සියයට 1%ක් පමණයි),
4. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) පමණක් වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 40,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50%ක්,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කරලීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.

යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය සඳහා 2001.06.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2001 .07.25 වැනි සිලෝන් ඩේලි නිව්ස්, දිවයින හා තිනකරන් යන පුවත්පත් ද බලන්න.

වැඩිදුර විස්තර ලබාගැනීම හා හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල ලිපිලේඛන පරීක්ෂාකර බැලීම කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ අංක 10 හි සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරු නීති (අයකර ගැනීම්) (දුරකථන 441179, 074-710179, 075-335208) වෙතින් සිදුකළ හැකිය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
සහ තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 08-224371, 08-227593
ෆැක්ස් : 08-224371
ඊ-මේල් samera@diamond.lanka.net

නගර කාර්යාලය :
අංක 55 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන අංක : 448526, 441761,
ෆැක්ස් : 448526, 575214
ඊ-මේල් samera@Sri. lanka.net

01-79

ඩී. එෆ්ජ්. සී. සී. බැංකුව
(කලින් ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

ලොට් 1 - අංක 2264

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තු උතුර හි, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරවන් කුඩිහි පිහිටි හජාරේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද අංක 2264 හා 90.08.26 දාතම දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දක්වා ඇති බෙදා වෙන්කළ හා මායිම් නිර්ණය කළ සම්පූර්ණ ඉඩම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියළු දේ ද සමග ඉඩම ප්‍රමාණයෙන් අක්කර 5, රූඩ් 0, පර්චස් 0.

ලොට් 1 - අංක 1097

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, කල්පිටිය කොට්ඨාශයේ, අක්කරෙයිපත්තු උතුරහි, කුරවන් කුඩි සහ නුරයිචෝලෙයි ග්‍රාමයේ පිහිටි, හජාරෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සංකරලිංගම් විසින් සාදන ලද අංක 1097 සහ 92.10.26 දාතම දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ හා මායිම් නිර්ණය කළ සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර 3, රූඩ් 3, පර්චස් 20 එය ඉහලින් හා දිගේ මාර්ග අයිතිය ද සමග කල්පිටිය, නුරයිචොලෙයි හි කාදර්වත්තේ, ඒ. ප්‍රනාන්දු සීඩ් අනියන් ෆාම්ස් (බීජ ඒෑණු ගොවිපල) හිමි වයික්කාලේ කම්මල දකුණ හි වර්ණකුලසූරිය ඇන්තනී පැට්රික් ප්‍රනාන්දු යන අය විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් තබන ලද දේපල අප විසින් 2002 ජනවාරි මස 25 වැනි දා සිකුරාදා ප. ව. 12.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය- මිල තීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය : -

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි),
4. රු. 30,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% හා. සේ. බ. (ජී. එස්. ටී.) 12.5% සමඟ ශ්‍රී ලංකා රජය හෝ වෙනයම් අධිකාරියක් විසින් අවශ්‍ය වූ විට පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, බදු හා අයකිරීම් ද වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය සඳහා 2001 සැප්තැම්බර් 28 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2001 සැප්තැම්බර් 10 වන දින අයිලන්ඩ්, දිවයින හා තිනක්කුරල් යන පුවත්පත් ද බලන්න.

වැඩිදුර විස්තර සඳහා දුරකථන 440366 මගින් ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් කරුණාකර විමසන්න.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා උසාවිය පිළිගත් කීර්තිමත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ
සහ උපදේශක තක්සේරුකරුවෝ.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 08-224371, 08-227593
ෆැක්ස් : 08-224371
ඊ-මේල් samera@diamond.lanka.net

නගර කාර්යාලය :
අංක 55 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන අංක : 448526, 441761,074-714999
ෆැක්ස් : 448526, 575214
ඊ-මේල් samera@Sri. lanka.net

01-80

සීමාසහිත සෙලාන් බැංකුව-හැටන් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල යටතේ පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. දයාමානවන් විසින් සහතික කරන ලද 1997.01.06 වෙනි දින අංක 8179 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම හැටන්, ඩන්බාර් පාර, අංක 52 හි පෙරියන්නන් සුප්පයියා කේසවමූර්ති බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 1998.11.30 වෙනි දින වන විට රු. 9,01,606.35 ක මුදලක් සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අය විය යුතුව ඇති හෙයින් එකී මුදල ද, 1998.12.01 වෙනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට 30% බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇති පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන දේපළ හා පරිශ්‍රය, 2002 ක් වූ ජනවාරි මස 21 වන දින පෙ. ව. 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, සහ කොට්ඨාශයේ දිඹුල කෝරළේ කුඩාඔය ගමේ පිහිටි දික්ඔය බලයලත් මිනින්දෝරු ආර්. තනගරත්නම් විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 17 වෙනි දින අංක 6463 දරන සැලැස්මේ පෙන්වා ඇත්තාවූද, ප්‍රමාණයෙන් අක්කර පහයි රූඩ් එකයි පර්චස් දහසයයි දශම හයයි හතරක් (අ. 5, රූ. 1, පර්. 16.64) *නැතහොත්* හෙක්ටයාර් 2.1667 ක් විශාලවූද එකී අංක 6463 දරන සැලැස්මේ මැනීම සහ විස්තරය අනුව, උතුරු-නැගෙනහිරට : ලොවිල් (තේ) වත්ත සහ පී. පී. එන්. යූ. 169/1 ද, දකුණු-නැගෙනහිරට : යුයිල්ජීල්ඩ් (තේ) වත්තද, දකුණු-බස්නාහිරට : එම වත්තේම ඉතිරි කොටස ද, උතුරු-බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද 1995.12.17 වෙනි දින අංක 6462 දරන සැලැස්මේ අංක 25, 8/ආර් 7 සහ 8/ආර් 6 බිම් කැබලි ද යන මායිම් තුළ පිහිටියාවූ ද කුඩාඔය එස්ටේට් හි කොටස නමැති බෙදා නිරූපණය කළ ඉඩම් කොටස සහ දේපළ එහි ඇති වෙනත් සියලු දේ ද සමගින් වේ.

ඉහත කී බෙදා නිරූපනය කළ ඉඩම් කොටස පහත ඉඩමෙහි අනු බෙදීමක් වේ :

මධ්‍යම පළාතේ, නුවරඑළිය කොට්ඨාශයේ සහ දිස්ත්‍රික්කයේ දිඹුල කෝරළේ කුඩාඔය ගමේ පිහිටි දික්ඔය බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 15 වෙනි දින අංක 6333 දරන සැලැස්මේ පෙන්වා ඇත්තාවූද, ප්‍රමාණයෙන් අක්කර දහතුනයි රූඩ් දෙකයි පර්චස් විස්සයි දශම පහක් (අ. 13 රූ. 2 පර්. 20.5) *නැතහොත්* හෙක්ටයාර් 5.5152 ක් විශාලවූ ද එකී අංක 6333 දරන සැලැස්මේ මැනීම සහ විස්තරය අනුව, උතුරට : ලොවිල් වත්ත ද, නැගෙනහිරට : පී. පී. එන්. යූ. 169/1 සහ යුයිල්ජීල්ඩ් වත්ත ද, දකුණට : එම වත්තේම ඉතිරි කොටස ද, බස්නාහිරට : එම වත්තේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි 'කුඩාඔය එස්ටේට්'හි කොටස නමැති බෙදා නිරූපනය කළ ඉඩම් කොටස සහ දේපළ එහි ඇති වෙනත් සියලු දේ ද සමගින් වේ.

ගෙවීමේ ක්‍රමය.– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා අයබදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නීති, සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලුපාර, කොළඹ 03.

දුරකථන අංක : 074-701274,074-701256,074-701291

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 64, අරුප්පොල මාවත,
මහනුවර.
දුරකථන : 08-233697, 072-223793, 071-755974,
ෆැක්ස් : 08-233697.

01-110/2

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-නුවරඑළිය ශාඛාව

නුවරඑළිය නගර සහා සීමාවන් තුළ 'සෙන්ට් එඩ්වර්ඩ්' නමැති ඉඩමෙන් බෙදූ කොටසක්. ග්ලේන් ෆෝල් පාරේ (GLENFALL ROAD) වරිපනම් අංක 28 දරන ඉතා වටිනා පදිංචියට/නිවාඩු නිකේතනයකට සුදුසු ගොඩනැගිල්ල ඇතුළු ඉඩම හා සියලු දේත් සමග ප්‍රමාණය පර්චස් 20

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. කනපතිපිල්ලේ විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද පිළිවෙලින් 1990.10.15, 1991.04.08, 1994.09.28, 1995.08.11 දින හා අංක 516, 600, 1429 හා 1634 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෝලංග බමුණුආරච්චිගේ නිහාල් මහේන්ද්‍රන් ජයවර්ධන ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් 1998.08.31 වන දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති රුපියල් 516,082.82ක මුදලට 1998.09.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට අයකර ගැනීම සඳහා පහත විස්තර වන දේපළ 2002 ක් වූ ජනවාරි මස 25 වන දින පෙ. ව. 11.30ට එම ඉඩමේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාශයේ, නුවරඑළිය මහ නගර සහා සීමාව තුළ පිහිටි සාන්ත එඩ්වර්ඩ්ස් නමැති ඉඩමෙන් බෙදා වෙන් කරනු ලැබූ බලයලත් මානක වී. ඒ. එල්. සෝමරත්න විසින් සාදනු ලැබූ අංක 3737 සහ 1968 අගෝස්තු 7 වන දිනැති පිඹුරෙහි අංක 59 දරන කැබැල්ල ලෙස දක්වා ඇති බෙදා වෙන් කළ ඉඩම වන එකී අංක 59 දරන කැබැල්ල උතුරට : එකී පිඹුරෙහි අංක 58 දරන කැබැල්ලෙන් ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි අංක ආර් 7 දරන කැබැල්ලෙන්ද, දකුණට : එකී පිඹුරෙහි අංක ආර් 4 දරන කැබැල්ලෙන් ද, බස්නාහිරට : එකී පිඹුරෙහි අංක 52 දරන කැබැල්ලෙන් ද මායිම් වන අංක 3737 දරන මිණුම් පිඹුරට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාලත්වය ඇති ඒ තුළ ඇති සියලු දේත් සමග වේ. ඉහත කී පිඹුරු අංක 3737 හි නිරූපනය කර ඇති කැබලි අංක R1- R 2 -R 4 -R 20 පාරවල් සඳහා වෙන්කර ඇති භූමිය මතින් පයින් හා වාහනවලින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ගෙවීමේ ක්‍රමය.– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා අයබදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, නීති (අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 20, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

දුරකථන අංක : 01-441179, 075-335208, 074-710179.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 64, අරුප්පොල මාවත,
මහනුවර.
දුරකථන : 08-233697, 072-223793, 071-755974,
ෆැක්ස් : 08-233697.

01-110/3

සීමාසහිත සෙලාන් බැංකුව-කොටගල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල යටතේ පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුවේ නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. ඕ. ද ලිවේරා විසින් සහතික කරන ලද 1994 නොවැම්බර් මස 25 වෙනි දින අංක 994, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. ද ලිවේරා විසින් සහතික කරන ලද 1996.10.18 වෙනි දින අංක 449 දරන බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්. ඒ. එමානුවල් විසින් සහතික කරන ලද අංක 207 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම අවිස්සාවේල්ල, 'හුසේනි එස්ටේට්' අංක 77 හි නල්ලුසාමි නාගරාජු නොහොත්නාගරාජා, බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ 2000.04.30 වෙනි දින වන විට රු. 8,25,305.36ක මුදලක් සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී මුදල ද, 2000.05.01 වෙනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට 30% බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇති පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන දේපළ හා පරිශ්‍රය, 2002 ක් වූ ජනවාරි මස 21 වන දින ප. ව. 3.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

මාතලේ නගර මධ්‍යයේ පිහිටි වටිනා ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් බලයලත් මිනින්දෝරු බී. එස්. ඒ. කෘෂන් මහතා විසින් 1943.04.13 වැනි දින මැන සාදන ලද අංක 182 දරන පිඹුරේ දක්වා ඇති මාතලේ ත්‍රිකුණාමල වීදියේ වරිපනම් අංක 86, 88 දරන පර්චස් දහඅටයි තිස් දෙකෙන් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 18.23/32) වපසරිය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිල්ල ඇතුළු සියලු දේපළ මහජන බැංකුවෙන් අප වෙත පවරන ලද බලය මත, 2002.01.25 දින පෙරවරු 10.30 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම :- මාතලේ / මහනුවර මාර්ගයේ අධ්‍යාපන කාර්යාලය ඉදිරිපිට මාර්ගයේ වම්පස පිහිටා ඇති ජාතික රක්ෂණ සංස්ථාව පවත්වන ගොඩනැගිල්ල සහ ඉඩම.

ගෙවීමේ ක්‍රම :

1. ගැණුම් මිලෙන් 25%ක් ;
2. වෙන්දේසිකරුගේ ගාස්තු, ගැණුම් මිලෙන් 2.5% යි (දෙකයි දශම පහ);
3. නගර සභා අයබදු වශයෙන් 1% ක් ;
4. විකුණුම් ගාස්තු සහ වෙනත් ගාස්තු වෙනොත් ඒ සැමද,
   ගැණුම් මිලෙන් 75% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් තුළ මහජන බැංකුව ගලේවෙල ශාඛාව වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වෙනත් විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මාතලේ. දුරකථන අංක - 066-22376 (ෆැක්ස්) 066 - 22032, 066-23894.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ
සහ කොන්ත්‍රාත්කරුවෝ.

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :	*නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව :*
අංක 24, ටොරින්ටන් පාර	අංක 55ඒ ධර්මපාල මාවත,
මහනුවර.	කොළඹ 03.
දුරකථන අංක : 08-224371, 08-227593 08-232343.	දුරකථන අංක : 01-448526, 01-714999

01-100

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 වන අධිකාරය) 22 වන වගන්තිය යටතේ පළ කරනු ලබන දැන්වීම

ලංකා බැංකු ආඥා පනතේ 19 වන වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මතකර ගන්නා ලදුව, 2001.11.02 දින අංක 1209 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සහ 2001.10.26 දින දිනමිණ සහ තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මුතිය ප්‍රකාර විකිණීමේ දිනය තෙක් ලැබිය යුතු ශේෂ මුදල, පොළිය, වියදම් සහ එකී ආඥා පනතෙන් 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55 ඒ හි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් 2002 ක් වූ පෙබරවාරි මස 09 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවේ, කොට්ඨාශ අංක 33 (බොරැල්ල උතුර) ආනන්ද රාජකරුණා මාවතහි (කලින් කැම්බල් පෙදෙස) පිහිටියාවූ ද, (දැන් වරිපනම් අංක 94/4 දරන) වරිපනම් අංක 94 සහ 94/1 දරන නුගගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1986 නොවැම්බර් 10 දිනැති අංක 2354 ඒ දරන පිඹුරේ ලොට් 5 වශයෙන් බෙදන ලද්දාවූ සහ විස්තර කරන ලද ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරේ ලොට් 04 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 09 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 06, 08 සහ 09 ද, බස්නාහිරට : අනාන්ද රාජකුරුණා මාවතේ වරිපනම් අංක 92 දරන පරිශ්‍රයද, මායිම්ව පර්චස් විසිදෙකයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 22.60) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 757/207 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහනගර සභා සීමාවේ කොට්ඨාශ අංක 33 (බොරැල්ල උතුර) ආනන්ද රාජකරුණා මාවතහි (කලින් කැම්බල් පෙදෙස) හි පිහිටියාවූ ද, නුගගහවත්ත නමැති ඉඩමේ එකී අංක 2354 ඒ දරන පිඹුරේ ලොට් 08 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ සහ විස්තර කරන ලද ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරේ ලොට් 05 සහ ලොට් 09 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 09 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 07 ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 06 ද, මායිම්ව පර්චස් දෙකයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 2.20) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 757/210 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රිකයේ, මහ නගර සභා සීමාවේ, කොට්ඨාශ අංක 33 (බොරැල්ල උතුර) ආනන්ද රාජකරුණා මාවතහි (කලින් කැම්බල් පෙදෙස) හි පිහිටියාවූ ද, නුගගහවත්ත නමැති ඉඩමේ එකී අංක 2354 ඒ දරන පිඹුරේ ලොට් 09 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද සහ විස්තර කරන ලද ඉඩම් කැබැල්ල උතුරට : ආනන්ද රාජකරුණා මාවත සහ එකී පිඹුරේ ලොට් 05 ද, නැගෙනහිරට : ආනන්ද රාජකරුණා මාවතේ වරිපනම් අංක 96 දරන ඕල් සෙන්ට්ස් කතෝලික පල්ලිය සහ එකී පිඹුරේ ලොට් 07 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 07 සහ 08 ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 01, 02, 03, 04, 05 සහ 08 ද මායිම්ව පර්චස් දහඅටයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 18.20) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 757/211 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අයකර ගැනීමේ කළමනාකරු.
දෙවනි ආයතනික ශාඛාව,

අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

01-114

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 3/6111 7/ඩී3/792.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.05.19 දින *ගැසට් පත්‍රයේ* සහ 2000.09.25 වැනිදා දිනමිණ පත්‍රයේ පළකරනු ලැබූවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2002.02.16 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ඔද්දරේ ග්‍රාමයෙහි පිහිටි වාගොල්ලවත්ත හෙවත් ගමඉමේහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ලියනගේ විසින් සකසන ලද 1959.11.11 දිනැති හා බලයලත් මිනින්දෝරු ඩී. රත්නායක විසින් සැකසුණු 1996.08.15 දින සහතික කරන ලද අංක 864 දරන පිඹුරේ කැබැලි අංක 1 වශයෙන් දක්වන ප්‍රමාණයෙන් අ. 5, රූ. 0, පර්. 5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්ලයේ වෙළුම්පත් අංක 335/90 හි ලියාපදිංචි වී ඇත.

තවද ඉහත කී අංක 864 දරන පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

යූ. එච්. ඩී. පත්මසිරි,
සාමාන්‍යාධිකාරී.

2001 දෙසැම්බර් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 3.

01-131/5

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/3/1894/කේවයි 2/338.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1998.11.06 දින *ගැසට් පත්‍රයේ* සහ 1999.05.17 වැනිදා දිනමිණ පත්‍රයේ පළකරනු ලැබූවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තරකර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2002.02.09 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන නගර සභා සීමාව තුළ කීර්තිරත්න මාවත, පල්ලෙ මඩවල පිහිටි හිටිනාවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එස්. පණ්ඩිතරත්න විසින් සැකැසුණු 1996.07.05 දින හා අංක 2386 දරන පිඹුරේ කැබලි අංක 2 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 14 1/2ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක බී 374/174 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී පිඹුර මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

යූ. එච්. ඩී. පත්මසිරි,
සාමාන්‍යාධිකාරී.

2001 දෙසැම්බර් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 3.

01-131/6

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්තිරීම් ආදිය

2002 අංක 01

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ, එස්. ඒ. එච්. ලලිත් ආර්. ද සිල්වා මහතා, 2001 මැයි මස 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-04/3

2002 අංක 02

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, සී. එස්. කුමාරසිංහ මහත්මිය, 2001 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-04/2

2002 අංක 03

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, සිමිලා පී. විතාන මහත්මිය 2001 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නැවත නියමයක් කරනතුරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

01-04/4

2002 අංක 04

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I වන පන්තියේ I වන ශ්‍රේණියේ ටී. ඩබ්ලිව්. පී. පීරිස් මහතා, 2001 ජූනි මස 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රජයේ රස පරීක්ෂක වශයෙන්.

01-14

2002 අංක 05

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, සී. ඩී. ඒ. ඒකනායක මහත්මිය, 2001 ජූනි මස 06 දින සිට 2001 අගෝස්තු මස 15 දින දක්වා අධිකරණ, ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරේ වැඩ බැලීමට.

01-07

2002 අංක 06

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ඩබ්ලිව්. ඩී. ජයසිංහ මහතා, 2001 ජූනි මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-04/1

2002 අංක 07

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ එච්. එල්. ඒ. ද සිල්වා මහතා, 2001 ජූනි මස 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

01-04/5

2002 අංක 08

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ, I වන ශ්‍රේණියේ ඩී. එස්. ගුණරත්න මහතා 2001 ජූලි මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට වැඩබැලීමේ පදනමින්.

01-135

2002 අංක 09

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ, I වන ශ්‍රේණියේ එන්. හේමා වි ජේසේකර මහත්මිය දැනට දරනු ලබන ස්ථිර තනතුරේ රාජකාරිවලට අමතරව 2001 අගෝස්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික නිවාස කොමසාරිස් තනතුරේ වැඩබැලීමට.

01-132

2002 අංක 10

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

එස්. ආර්. එම්. එම්. රත්නායක මහතා, කොන්ත්‍රාත් පදනම මත 2001 සැප්තැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයකට පමණත් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන්.

01-134/2

2002 අංක 11

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ පී. ඒ. අබේසේකර මහතා, 2001 සැප්තැම්බර් මස 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සහා, පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වශයෙන්.

01-10/1

2002 අංක 12

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ඒ. සී. එම්. රාසික් මහතා, 2001 සැප්තැම්බර් මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, මහාමාර්ග සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

01-09

2002 අංක 13

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත.

ආචාර්ය ඩී. එම්. කරුණාරත්න මහතා පෙරලා දිවයිනට පැමිණෙන තුරු ජී. ඩී. ඩී. කේ. පෙරේරා මහතා තම රාජකාරිවලට අමතරව, 2001 සැප්තැම්බර් මස 23 දින සිට 2001 ඔක්තෝබර් මස 05 වැනි දින දක්වා බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ වරයාගේ රාජකාරි ඉටු කිරීමට.

01-12

2002 අංක 14

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ එච්. බන්දුරත්න මහතා, 2001 ඔක්තෝබර් මස 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-04/06

2002 අංක 15

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

එන්. නවරත්නරාජා මහතා, 2001 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් වසරක කාලයකට විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

01-11

2002 අංක 16

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

වෛද්‍ය ඒ. එම්. එල්. බෙලිගස්වත්ත මහතා 2001 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සුදුසු නිලධරයෙකු පත් කරනු ලබන තුරු හෝ මාස හයක (06) උපරිම කාලයකට කොන්ත්‍රාත් පදනමින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-15

2002 අංක 17

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ආචාර්ය ආර්. ඒ. ඩී. බී. සමරනායක මහතා 2001 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීමට.

01-133

2002 අංක 18

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ජී. පියසේන මහතා, 2001 නොවැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-05

2002 අංක 19

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එස්. ඩී. චන්ද්‍රදාස මහතා, 2001 නොවැම්බර් මස 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු අධිසේවක සංඛ්‍යා පදනම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සහා, පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

01-10/2

2002 අංක 20

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ කේ. ෂන්මුගනාදන් මහතා, කොන්ත්‍රාත් පදනමින් 2001 නොවැම්බර් මස 19 දින සිට වසරක කාලයකට යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත/දිස්ත්‍රික් ලේකම් වශයෙන්.

01-134/1

2002 අංක 21

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ජේ. ඒ. ආරියසේන මහතා, 2001 නොවැම්බර් මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වරාය, නාවික හා ධීවර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

01-08

2002 අංක 22

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

බී. ටී. පෙරේරා මහතා 2001 නොවැම්බර් මස 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වශයෙන්

01-13

2002 අංක 23

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

එල්. කේ. රත්නසිරි මහතා, 2001 සැප්තැම්බර් මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු, රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන්.

01-10/3

වෙනත් පත්කිරීම් ආදිය

2002 අංක 24

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

ස්ථිර බල හමුදාව

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට කපිතන් (උපකරණ පාලක) නිලයේ ස්ථිර කිරීම් අනුමත කර තිබේ :-

(අ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක) වික්ටර් ජස්ටින් ප්‍රනාන්දු, ශ්‍රීලයුසේබ 1993 මැයි 18

(ආ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) කාන්ගන මුදියන්සේලාගේ ප්‍රේමදාස, යූඑස්පී ගැහේබ 1995 අගෝස්තු 01

(ඇ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) මතුමගේ සරත් ධර්මසිරි පෙරේරා, ශ්‍රීලංසිරෙ 1996 පෙබරවාරි 06

(ඈ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) සුදසිංහගේ දොන් ජිනදාස ශ්‍රීලයුසේබ 1996 පෙබරවාරි 06

(ඉ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) විජිත වින්සන්ට් කුමාරපේලි, ශ්‍රීලපාහ 1996 පෙබරවාරි 06

(ඊ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) මුදියන්සෙලාගේ කිරිබණ්ඩා වාසල, ශ්‍රීලංඉ 1996 පෙබරවාරි 06

(උ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) මොරගහ කුඹුරගෙදර ශාන්ත සිරි සුමනසේන, යූඑස්පී ශ්‍රී ලයු වෛබ 1996 දෙසැම්බර් 06

(ඌ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) නානායක්කාර හද්දුගොඩගේ උපාලි සරත් යාපා, යූඑස්පී ශ්‍රීලයුයුබ 1996 දෙසැම්බර් 06

(එ) ලුතිනන් (උපකරන පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) දලවැල්ලෙ හේවාගේ සුමනසේන, යූඑස්පී ඉසේරෙ 1996 දෙසැම්බර් 06

(ඒ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) වික්‍රම ආරච්චිල්ලාගේ ඇල්ප්‍රඩ් වීරසිරි, යූඑස්පී ගැහේබ 1996 දෙසැම්බර් 06

(ඔ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) විදාන කාරියකරනගේ දොන් සිරිසේන, ශ්‍රීලසසබ 1996 දෙසැම්බර් 06

(ඕ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) බස්නායක මුදියන්සේලාගේ සුනිල් තිලකරත්න, යූඑස්පී ශ්‍රීලකාහ 1996 දෙසැම්බර් 06

(ක) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) තලවත්තේ ආචාරිගේ විජේදාස, ශ්‍රීලයුසේබ 1996 දෙසැම්බර් 06

(ග) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) නවසිය මුදියන්සේලාගේ ජයවීර, ශ්‍රීලංසිරෙ 1996 දෙසැම්බර් 06

(ජ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) පොහොරඹගේ විජයසිංහ, ශ්‍රීලපාහ 1996 දෙසැම්බර් 06

(ඩ) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) මහබාගේ ගෙදර සෝමරත්න, ගරෙ 1996 දෙසැම්බර් 06

(න) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) සුරවීර ආරච්චිගේ දොන් රංජිත් ඇනට් ක්ලීටස් ශ්‍රීලංසිරෙ 1996 දෙසැම්බර් 06

(ත) ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතන් (උපකරණ පාලක)) රම්‍ය ලියනගේ, ශ්‍රීලපාහ 1996 දෙසැම්බර් 06

එල්පී බලගල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2001 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ, යුද්ධ හමුදා මූලස්ථානයේ දී ය.

01-54

2002 අංක 25

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45(2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය බැටි වීරකෝන් වන මම,

01. ගාමිණී ජයසේන මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
02. පී. දයානන්ද ගුණතිලක මහතා, කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
03. ඩබ්. බී. පිටවෙල මහතා, බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
04. කපුගමගේ වීරසිංහ මහතා, හොරණ අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
05. නීතා වික්‍රමසිංහ මහත්මිය, කොළඹ, කළුතර, ගම්පහ අධිකරණ කලාප සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
06. ඩබ්. ඒ. ඩී. ජයකාන්ත මහතා, මොරටුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
07. බී. එල්. ඩී. ඩේවිඩ් මහතා, බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
08. ඇස්. ඩී. සුමනපාල මහතා, කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
09. ඇපා ආරච්චිල්ලාගේ පුංචි බණ්ඩා මහතා, කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
10. ප්‍රේමතිලක හපුවිට මහතා, කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
11. කැප්පිටියගොඩ විතානගේ දොන් කරුණාදාස මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
12. දොම්මනිගේ අමරසේන මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
13. අමරදාස ඌරලගමගේ මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
14. කනපැද්දල ලොකුගේ සුගතදාස මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයාකාරවරයෙකු වශයෙන් ද,
15. කේ. ඇම්. සිරිසේන මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
16. පූජ්‍ය රාකව අස්සජි නායක හිමි, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
17. නල්ලපෙරුම ආරච්චිගේ අභයසිරි පියසෝම මහතා, ඇල්පිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
18. රණසිංහ මුහන්දිරම් නන්දිසෝම ද සිල්වා මහතා, බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
19. බී. එච්. ඒ ධනසිරි මහතා, ඇල්පිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
20. ලාල් වංසපාල ගුණරත්න ද සිල්වා මහතා, බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
21. කළු මුදියන්සේලාගේ සුමතිපාල මහතා, ඇල්පිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
22. ඇම්. ජී. වීරසේන මහතා, ඇල්පිටිය අධිකරණ දිස්ත්‍රික්කයේ සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
23. ජයතිලක ඇල්විටිගල මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
24. සීසර් දයානන්ද වික්‍රමසිංහ මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
25. පූජ්‍ය වැයිහේනේ පද්මසිරි හිමි, ඇල්පිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
26. හතරසිංහ වික්‍රමආරච්චිගේ රංජිත් ගාමිණී පියසේන මහතා, කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
27. නාගලිංගම් පේරම්පලම් පරමලිංගම් මහතා, කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
28. තඹවිටගේ දොන් ජයසේන මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
29. මයිලන්ගේ සුමණාවතී පතිරගේ මහත්මිය, ගල්කිස්ස අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
30. රණවීර පේඩිගේ සුනිල් මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
31. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. පුංචි බණ්ඩා මහතා, බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
32. වික්‍රමනායක විජයරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
33. පරණාකලගේ පේමචන්ද්‍ර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

බැටි වීරකෝන්,
අධිකරණ, ජනවාර්ගික කටයුතු හා
ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2001 දෙසැම්බර් මස 04 වැනි දින,
අධිකරණ, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
කොළඹ 12.

01-53

ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය : ආ/1අ/3/8.

තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

මෙයට ඇතුළත් උපලේඛනයේ II වන තීරයෙහි සඳහන් අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූප I වන තීරයෙහි සඳහන් තනතුර දරන සෑම තැනැත්තෙකුම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය ප්‍රකාරව සහ එම විධිවිධාන වලට යටත්ව තනතුර දරන කාලය තුළ විශ්‍රාම වැටුප් සුදුසුකම් සහිත අයෙකු බව මෙයින් දන්වනු ලැබේ.

එම්. එන්. ජුනයිඩ්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,
පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය.

2001ක් වූ නොවැම්බර් මස 29 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

උපලේඛනය

I වන තීරය	II වන තීරය
01. සහකාර ස්ථාන භාර නිලධාරී ග්‍රහලෝකාගාරය	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
02. විද්‍යා හා තාක්ෂණ නිලධාරී	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
03. මෝටර් යාන්ත්‍රික - I වැනි පංතිය II ශ්‍රේණිය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

01-06

මාතලේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන්ගේ කාර්යාල ලිපිනය

අනු අංකය	ලිපිනය
01.	ග්‍රාම නිළධාරී, ආදාවල, මඩවල උල්පත, මාතලේ.
02.	ග්‍රාම නිළධාරී, ලිහිණිපිටිය, මඩවල උල්පත, මාතලේ.
03.	ග්‍රාම නිළධාරී, ඕපල්ගල, මාතලේ.
04.	ග්‍රාම නිළධාරී, අඹන, අඹන කෝන්ගහවෙල, මාතලේ.
05.	ග්‍රාම නිළධාරී, සේනාගම, අඹන. කෝන්ගහවෙල, මාතලේ.
06.	ග්‍රාම නිළධාරී, මොරගහමඩ, අඹන, කෝන්ගහවෙල, මාතලේ.
07.	ග්‍රාම නිළධාරී, කඹරව, තලාගොඩ හන්දිය, මාතලේ.
08.	ග්‍රාම නිළධාරී, ගල්පෝරුගොල්ල, තලාගොඩ හන්දිය, මාතලේ.
09.	ග්‍රාම නිළධාරී, හැළඹගහවත්ත, පුබ්බිලිය, මාතලේ.
10.	ග්‍රාම නිළධාරී, දඹගොල්ල, පුබ්බිලිය, මාතලේ.
11.	ග්‍රාම නිළධාරී, බඹරගහවත්ත, පුබ්බිලිය, මාතලේ.
12.	ග්‍රාම නිළධාරී, මාරාගමුව, පුබ්බිලිය, මාතලේ.
13.	ග්‍රාම නිළධාරී, පුබ්බිලිය, පුබ්බිලිය, මාතලේ.
14.	ග්‍රාම නිළධාරී, ඇලගමුව, තලාගොඩ හන්දිය, මාතලේ.
15.	ග්‍රාම නිළධාරී, තලාගොඩ, තලාගොඩ හන්දිය, මාතලේ.
16.	ග්‍රාම නිළධාරී, කඩවත තලාගොඩ හන්දිය, මාතලේ.
17.	ග්‍රාම නිළධාරී,මැදපිහිල්ල, කෝන්ගහවෙල මාතලේ.
18.	ග්‍රාම නිළධාරී, ගල්බොඩ, කෝන්ගහවෙල, මාතලේ.
19.	ග්‍රාම නිළධාරී, කෝන්ගහවෙල, කෝන්ගහවෙල, මාතලේ.
20.	ග්‍රාම නිළධාරී, රජවෙල, කෝන්ගහවෙල, මාතලේ.
21.	ග්‍රාම නිළධාරී, මිල්ගහමුලතැන්න, කෝන්ගහවෙල, මාතලේ.
22.	ග්‍රාම නිළධාරී, මොරගොල්ල, නාඋල, මාතලේ.
23.	ග්‍රාම නිළධාරී, පිළිහුඩුගොල්ල ඉහළ, නාඋල මාතලේ.
24.	ග්‍රාම නිළධාරී, අරංගල, නාඋල මාතලේ.
25.	ග්‍රාම නිළධාරී, පිළිහුඩුගොල්ල පහළ, නාඋල මාතලේ.
26.	ග්‍රාම නිළධාරී, හබරගහමඩ, නාඋල මාතලේ.
27.	ග්‍රාම නිළධාරී, කරවිලහේන, නාඋල, මාතලේ.
28.	ග්‍රාම නිළධාරී, කුඹියන්ගහඇල, කෝන්ගහවෙල, මාතලේ.
29.	ග්‍රාම නිළධාරී, හාඩුවෙල, දෙවරාදපොළ, කෝන්ගහවෙල, මාතලේ.
30.	ග්‍රාම නිළධාරී, හාඩුව, නාඋල, මාතලේ.
31.	ග්‍රාම නිළධාරී, ගංඉමයාය, කෝන්ගහවෙල, මාතලේ.
32.	ග්‍රාම නිළධාරී, බෝවතැන්නවත්ත, කෝන්ගහවෙල, මාතලේ.
33.	ග්‍රාම නිළධාරී, මිගහඇල, කෝන්ගහවෙල, මාතලේ.
34.	ග්‍රාම නිළධාරී, දොඩම්අත්තාවල, නාඋල, මාතලේ.
35.	ග්‍රාම නිළධාරී, බිබිල, නාඋල, මාතලේ.
36.	ග්‍රාම නිළධාරී, නිකුල, නාඋල, මාතලේ.
37.	ග්‍රාම නිළධාරී, නාඋල, නාඋල, මාතලේ.
38.	ග්‍රාම නිළධාරී, උස්සැත්තෑව, නාඋල, මාතලේ.
39.	ග්‍රාම නිළධාරී, පෙනළබඩ, නාඋල, මාතලේ.
40.	ග්‍රාම නිළධාරී, මේල්පිටිය, මේල්පිටිය, මාතලේ.
41.	ග්‍රාම නිළධාරී, මුරුතෝලුව, මේල්පිටිය, මාතලේ.
42.	ග්‍රාම නිළධාරී, දියත්කඩුව, නාලන්ද, මාතලේ.
43.	ග්‍රාම නිළධාරී, වැවැත්තෑව, මේල්පිටිය, මාතලේ.
44.	ග්‍රාම නිළධාරී, නාලන්ද, නාලන්ද, මාතලේ.
45.	ග්‍රාම නිළධාරී, සේරුදණ්ඩාපොළ, ලෙනදොර, මාතලේ.
46.	ග්‍රාම නිළධාරී, උඩුදෙනිය, නාලන්ද, මාතලේ.
47.	ග්‍රාම නිළධාරී, අලුගොල්ල, නාලන්ද, මාතලේ.
48.	ග්‍රාම නිළධාරී, හපුගස්යාය, නාලන්ද, මාතලේ.
49.	ග්‍රාම නිළධාරී, බොබැල්ල, නාඋල, මාතලේ.
50.	ග්‍රාම නිළධාරී, ඇල්හේන, නාලන්ද, මාතලේ.
51.	ග්‍රාම නිළධාරී, මීගොල්ල, නාලන්ද, මාතලේ.
52.	ග්‍රාම නිළධාරී, වම්බටුයාය, නාලන්ද. මාතලේ.

01-26

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

සඳහා 2002.01.04 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන භාර ගන්නා අවසාන දිනය සහ වේලාතව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2002 ජනවාරි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2001 දෙසැම්බර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2002 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදි.
මුද්‍රණය හා බෙදාහැරීම සීමා සහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මගිනි.

ආණ්ඩුවේ දැන්වීම්

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 459 යොමු අංකය මීග/3/අත්/ 139(IV) 2.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම රජයට අත්කර ගැනීමට බලාපොරොත්තු වේ/අත්කර ගෙන තිබේ. වැඩි විස්තර සඳහා අංක 1197/6 දරන 2001.08.14 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග,
අත්පත් කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මීගමුව.

2001.08.06 දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, මීගමුව.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	ගම්පහ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	මීගමුව
ග්‍රාම නිලධාරි කොට්ඨාසය	:	අංක 159ඒ, හුණුපිටිය, අංක 73 ඒ, කුඩාපාඩුව
ගමේ නම	:	කට්ටුව,පෙරියමුල්ල
ඉඩමේ නම	:	පැලියගොඩ-පුත්තලම් මාර්ගය දෙපස
සැලසුම් අංකය	:	ගම්. 3026
කැබලි අංකය	:	01 සිට 40 දක්වා

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 460 යොමු අංකය: මීග/3/අත්/ 139(III) 1

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම රජයට අත්කර ගැනීමට බලාපොරොත්තු වේ. / අත්කර ගෙන තිබේ. වැඩි විස්තර සඳහා අංක 1197/6 දරන 2001.08.14 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
අත්පත් කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මීගමුව.

2001.08.06 දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, මීගමුව.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	ගම්පහ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	මීගමුව
ග්‍රාම නිලධාරි කොට්ඨාසය	:	අංක 75ඒ, පලහතුරය, අංක 75, කට්ටුව
ගමේ නම	:	කට්ටුව
ඉඩමේ නම	:	පැලියගොඩ-පුත්තලම් මාර්ගය දෙපස
සැලසුම් අංකය	:	ගම්. 3048
කැබලි අංකය	:	01 සිට 143 දක්වා

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 461

යොමු අංකය: මීග/3/අත්/ 139(IV) 4

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කෙරෙන ඉඩම රජයට අත්කර ගැනීමට බලාපොරොත්තු වේ. / අත්කර ගෙන තිබේ. වැඩි විස්තර සඳහා අංක 1197/6 දරන 2001.08.14 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
අත්පත් කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මීගමුව.

2001.08.06 දින.
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, මීගමුව.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	ගම්පහ
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	මීගමුව
ග්‍රාම නිලධාරි කොට්ඨාසය	:	අංක 73ඒ, කුඩාපාඩුව, අංක 159ඒ, හුණුපිටිය
ගමේ නම	:	පෙරියමුල්ල
ඉඩමේ නම	:	පැලියගොඩ-පුත්තලම් මාර්ගය දෙපස
සැලසුම් අංකය	:	ගම්. 3025
කැබලි අංකය	:	01 සිට 48 දක්වා

ටෙන්ඩර් නිවේදනය

පොලිස් දෙපාර්තමේන්තුව

එන්. 458

මෙහි පහත සඳහන් ටෙන්ඩර් උපලේඛනයට ඇතුලත් අයිතම සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් ටෙන්ඩර්පත් භාර ගනු ලබන අතර උපලේඛණයේ සඳහන් වන පරිදි එක් එක් දිනයන්හි දී 1400 පැයට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

කොළඹ 01, පොලිස් මූලස්ථානයෙහි අධ්‍යක්ෂ (සැපයුම්) වෙතින් ලබා ගත් ආකෘති පත්‍රවලින් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. එක් එක් ටෙන්ඩරය සඳහා ආපසු නොගෙවන රු. 1000 ක ටෙන්ඩර් ගාස්තුවක් කොළඹ 01, පොලිස් මූලස්ථානයෙහි ගණකාධිකාරී ප්‍රවර්ථන වෙත සතියේ වැඩ කරන දිනයන්හි පැය 0900 සිට පැය 1500 දක්වා කාලය තුල මුදලින් ගෙවීමෙන් පසු ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකි වේ.

එක් එක් දිනයන්හි ටෙන්ඩර් භාර ගැනීම අවසාන වූ වහාම එම ටෙන්ඩර්පත් කොළඹ 01, පොලිස් මූලස්ථානයේ ගණකාධිකාරී (ප්‍රවර්ථන) කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙකී ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

දේශීය නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, විදේශීය නියෝජකයන් හෝ ඔවුන්ගේ පිළිගත් නියෝජිතයන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවීම, අතින් ගෙනවිත් භාර දීම හෝ කොළඹ 01, පොලිස් මූලස්ථානයේ ගණකාධිකාරී/සහායක සේවා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමද කළ හැකිය. ටෙන්ඩර් පත් ටෙන්ඩර් භාර ගැනීම අවසාන කරනු ලබන වේලාවට ප්‍රථම ලැබෙනසේ එවිය යුතුය.

කොළඹ 01, පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂ/සැපයුම් කාර්යාලයේ දී ටෙන්ඩර් ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

වැඩිදුර විස්තර සඳහා අමතන්න - අධ්‍යක්ෂ(සැපයුම්) 320729
අධ්‍යක්ෂ(ප්‍රවාහන) 593019
පොලිස් අධිකාරී(සැපයුම්)1 324915

පොලිස්පති.

උපලේඛනය

පොලිස් ප්‍රවාහන කොට්ඨාසය සඳහා මෝටර් රථ අමතර කොටස් හා උපාංග

ටෙන්ඩර් අංකය	*අයිතමය*	*ප්‍රමාණය*	*අවසන්වන දිනය*
01.	සුසුකි වී එක්ස් 800 යතුරුපැදි	ලැයිස්තුවට අනුව	2002.03.13
02.	සුසුකි ජී එස් එක්ස් 500 යතුරුපැදි	එම	2002.03.13
03.	සුසුකි ජී එස් එක්ස් 450 යතුරු පැදි	එම	2002.03.13
04.	සුසුකි ජී එස් එක්ස් 400 යතුරුපැදි	එම	2002.03.13
05.	සුසුකි ජී එන් 250 යතුරුපැදි	එම	2002.03.13
06.	යමහා එස් ආර් 250 යතුරු පැදි	එම	2002.03.14
07.	හොන්ඩා සී ඩී 200 යතුරු පැදි	එම	2002.03.14
08.	ලැන්ඩ් රෝවර් 110 ඩිපෙන්ඩර් වී. ඩී. අයි. - 300	එම	2002.03.14
09.	ටොයොටා ලැන්ඩ් කෘෂර් - බී. ජේ. 75	එම	2002.03.14
10.	ටොයොටා ලැන්ඩ් කෘෂර් - පී ඉසඩ් ජේ 75	එම	2002.03.15
11.	ටොයොටා ලැන්ඩ් කෘෂර් - එච් ඉසඩ් ජේ 78 ආර්	එම	2002.03.15
12.	මිට්සුබිෂි පැජරෝ වී 36	එම	2002.03.15
13.	ඉසුසු ටැපර් යු බී එස් 55	එම	2002.03.15
14.	පෝජෝ 405 කාර්	එම	2002.03.18
15.	නිසාන් සනී - එන් 16 කාර්	එම	2002.03.18
16.	නිසාන් සනී - බී 12 කාර්	එම	2002.03.18
17.	නිසාන් සනී - බී 14 කාර්	එම	2002.03.18
18.	මිට්සුබිෂි ලාන්සර් - සී 61 කාර්	එම	2002.03.19
19.	මිට්සුබිෂි ගැලන්ට් කාර්	එම	2002.03.19
20.	ටොයොටා කොරොල්ලා - ඊ ඊ 90 කාර්	එම	2002.03.19
21.	ටොයොටා ටර්සල් කාර්	එම	2002.03.19
22.	මිට්සුබිෂි ඩබල් කැබ් - එල් 200	එම	2002.03.20
23.	ඉසුසු ඩබල් කැබ්	එම	2002.03.20
24.	මැස්ඩා 323 කාර්	එම	2002.03.20
25.	සුබාරු 1.3 කාර්	එම	2002.03.20
26.	ටොයොටා හයිඒස් වෑන් රථ - 113/3 එල්	එම	2002.03.21
27.	ටොයොටා ඩොල්ෆින් වෑන් - 114/2එල්	ලැයිස්තුවට අනුව	2002.03.21
28.	මර්සඩීස් බෙන්ස් වෑන් - එම්. බී. 100	එම	2002.03.21
29.	ටොයොටා කෝස්ටර් මිනි බස්	එම	2002.03.21
30.	ටාටා 1313 රථ	එම	2002.03.22
31.	ටාටා 1612 රථ	එම	2002.03.22
32.	එම් එෆ්ප් 240 ට්‍රැක්ටර්	එම	2002.03.22
33.	අශෝක් ලේලන්ඩ් කොමෙට් රථ	එම	2002.03.22
34.	අශෝක් ලේලන්ඩ් - කාර්ගෝ 709	එම	2002.03.22
35.	ජේ සී බී බැකෝ ලෝඩර්ස්	එම	2002.03.25
36.	ටයර් සහ ටියුබ් (ආනයනික)	එම	2002.03.25
37.	බැටරි (ආනයනික)	එම	2002.03.25
38.	විවිධ අයිතමයන්	එම	2002.03.25
39.	තීන්ත වර්ග	එම	2002.03.25
ගරාජ උපකරණ :			
40.	ගරාජ උපකරණ	එම	2002.03.26
41.	විවිධ ගරාජ අයිතමයන්	එම	2002.03.26
අපරාධ වාර්තා කොට්ඨාසය :			
42.	ඇඟිලි සලකුණු උපකරණ	එම	2002.03.27
43.	ඇඟිලි සලකුණු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය	එම	2002.03.27
44.	ඡායාරූප උපකරණ	එම	2002.03.27
45.	ඡායාරූප සඳහා අවශ්‍ය ද්‍රව්‍ය	එම	2002.03.27